# “සිංහලෙන් පැය දෙකක්” සම්මාන දිනයි

## ඔස්ට්‍රේලියාවේ විශිෂ්ටතම වාර්ගික ගුවන් විදුලි වැඩසටහන



මෙල්බර්න් නුවර 97.1 FM ඔස්සේ විකාශය වන 3MDR ගුවන් විදුලියේ සිංහල වැඩසටහන - සිංහලෙන් පැය දෙකක් 2012 වසරේ ඔස්ට්‍රේලියාවේ විශිෂ්ටතම වාර්ගික ගුවන් විදුලි වැඩසටහන හිමි සම්මානයෙන් පිදුම් ලැබීය. ඔස්ට්‍රේලියාවේ සියලුම වාර්ගික ගුවන් විදුලි වැඩසටහන් සලකා බලන මෙම උළෙල සංවිධානය කරන්නේ ඔස්ට්‍රේලියාවේ ජාතික වාර්ගික සහ බහු සංස්කෘතික මාධ්‍යවේදීන්ගේ කවුන්සිලයයි.

සිංහලෙන් පැය දෙකක් - මෙම සම්මානයෙන් පිදුම් ලැබූ පළමු ශ්‍රී ලාංකික ගුවන් විදුලි වැඩසටහනයි. පසුගිය වසරේ අගෝස්තු මස ඇරඹුණ සිංහලෙන් පැය දෙකක් සෑම ඉරිදාම පෙරවරු 10 සිට පැය දෙකක කාලයක් විකාශය කෙරේ. www.3mdr.com වෙබ් අඩවියෙන් සහ TuneIn App ඔස්සේ ද සවන් දිය හැකි ය.

“සිංහලෙන් පැය දෙකක්” තිසර (www.sannasa.net or www.thisara.com) ගුවන් විදුලියේ ආරම්භයේ සිටම ඒ ඔස්සේ ද ප්‍රචාරය වෙයි

දෙකක් වැඩසටහනයි. සිංහලෙන් පැය දෙකක් ගුවන් විදුලි වැඩසටහන ගෙන එන්නේ චරිත දිසානායක, ලසන්ත බෝයගම, දිල්රුක්ෂි විජේසූරිය, උත්පල ප්‍රේමවර්ධන, මධූ තලගල, දිලූප ද සිල්වා ඇතුළු පිරිසකි.

ඔස්ට්‍රේලියාව පුරා විවිධ භාෂා 100කින් සතියකට පැය 2000කට අධික කාලයක් වාර්ගික ගුවන් විදුලි වැඩසටහන් විසුරුවා හැරේ.




## විශ්ව රංගායතනයේ සිසු සිසුවියෝ ජනපති හමුවෙති



ඕස්ට්‍රෙලියාවේ මෙල්බර්න් හි විශ්ව රංගායතනයේ සිසු සිසුවියෝ “ විජය - කුවේණි” නර්තන නළුව ජනවාරි 5 වන දින කොළඹ නෙළුම් පොකුණ රඟහලේ දී නැවත වතාවක් වේදිකා ගත කළ හ.

මේ සංචාරයේ දී ඔවුහු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා හමුවීමේ භාග්‍යය ද ලද්දා හ. මේ එම අවස්ථාවයි.

“විජය - කුවේණි” වේදිකා ප්‍රසංගය නර්තනාචාරිණී රසිකා කුලසිංහ මහත්මියගේ නිර්මාණයකි





